# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.
# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020
# පාසල් පාදක තක්සේරුකරණය යටතේ (40) සංගීතය (පෙරදිග) විෂයට අදාළ 11 ශ්‍රේණියේ අවසාන තක්සේරුකරණ

**තක්සේරුකරණ ක්‍රියාකාරකම්**

- 6 ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා සංගීතය විෂය හදාරා අවසන් වූ අයදුම්කරුවෙකුගේ අවසන් ප්‍රායෝගික තක්සේරුකරණය ලෙසට මෙම අවස්ථාව නම් කළ හැකි ය. එබැවින් ස්වර, රාග, තාල, මූලික කර ගනිමින් සමස්ත ප්‍රායෝගික හැකියාවන් ආවරණය වන පරිදි සහ සංගීතය පිළිබඳ **පොදු හා සාමාන්‍යය ප්‍රායෝගික හැකියා** මැන බැලෙන පරිදි මෙම අවසාන තක්සේරුකරණයේ දී සරල ක්‍රියාකාරකම් 6 ක් සැලසුම් කර ඇත.

පරීක්ෂක මණ්ඩලයක සාමාජිකයින් 3 කි.

ප්‍රධාන පරීක්ෂක - අදාළ කලාපයේ සංගීතය (පෙරදිග) විෂය සම්බන්ධව අත්දැකීම් සහිත විෂය අධ්‍යක්ෂකවරයෙක් / ගුරු උපදේශකවරයෙක්/10-11 ශ්‍රේණිවල සංගීතය (පෙරදිග) විෂය ඉගැන්වීමෙහි නිරතවන අත්දැකීම් සහිත ගුරුවරයෙක්.

පරීක්ෂක 01 - අදාළ කලාපයේ 10-11 ශ්‍රේණිවල සංගීතය (පෙරදිග) විෂය ඉගැන්වීමෙහි නිරතවන අත්දැකීම් සහිත ගුරුවරයෙක්.

පරීක්ෂක 02 - පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන සිසුන්ට සංගීතය (පෙරදිග) විෂය උගන්වන ගුරුවරයා

පරීක්ෂක 01 හා පරීක්ෂක 02 අතුරින් එක් අයකු තාල වාදනයට දක්ෂතා ඇති අයකු වන පරිදි තෝරා ගත යුතුය.

- එක් එක් අපේක්ෂකයාගේ ප්‍රායෝගික ලකුණු සටහන් කිරීමට ඔබ මණ්ඩලයට සපයා ඇති **'විස්තරාත්මක ලකුණු සටහන් පත්‍රය' එක් එක් අපේක්ෂකයාට එක බැගින් වෙන වෙන ම භාවිත කළ යුතු වේ**. පරීක්ෂක මණ්ඩලයේ තිදෙනාගේ ම එකඟතාව මත අපේක්ෂකයාගේ ප්‍රායෝගික නිපුණතාව ආසන්න මට්ටම, සම්මාන මට්ටම, ඉහළ මට්ටම, විශිෂ්ට මට්ටම වශයෙන් ඉදිරියේ ඇති 1,2,3,4, යන ලකුණු අතුරෙන් සුදුසු ලකුණ වටා රවුමක් යොදා තීරණය කළ හැකි ය. ක්‍රියාකාරකම අවසානයේ ඇති කොටුව තුළ ක්‍රියාකාරකමට හිමි සම්පූර්ණ ලකුණ යෙදිය හැකි ය.

- මෙම වර්ෂයේ දී පහත දැක්වෙන ක්‍රියාකාරකම් 6 මෙම අවසාන ප්‍රායෝගික තක්සේරුකරණය සඳහා යොදා ගැනීමට යෝජිත ය. ඒ ඒ ක්‍රියාකාරකම්වල සෑම අනුකොටසකට ම ලකුණු 04 ක් බැගින් වෙන්කර ඇත.

**ලකුණු බෙදී යාමේ සාරාංශය.**

| | | | | |
|---|---|---|---|---|
| 1. | ක්‍රියාකාරකම | :- ශ්‍රවණ පරීක්ෂණය | - | ලකුණු 12 යි. |
| 2. | ක්‍රියාකාරකම | :- රාගධාරී ගායන/වාදන ප්‍රායෝගික ක්‍රියාකාරකම් | - | ලකුණු 20 යි. |
| 3. | ක්‍රියාකාරකම | :- රාග/ස්වර ඥානය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් | - | ලකුණු 12 යි. |
| 4. | ක්‍රියාකාරකම | :- ව්‍යවහාරික සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් | - | ලකුණු 16 යි. |
| 5. | ක්‍රියාකාරකම | :- ජන ගී පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් | - | ලකුණු 16 යි. |
| 6. | ක්‍රියාකාරකම | :- වාදනය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් | - | ලකුණු 24 යි |
| | | | | මුළු ලකුණු 100 යි. |

## එක් එක් ක්‍රියාකාරකම සඳහා ලකුණු පිරිනැමීමේ නිර්ණායක හා ක්‍රමවේදය

### 1. ක්‍රියාකාරකම :- ශ්‍රවණ පරීක්ෂණය

- වරුවට නියමිත **සියලු ම සිසුන් එකවර** යොදා ගනිමින් මෙම ක්‍රියාකාරකම සිදුකළ යුතුය. සිසුන් ට ලකුණු සටහන් පත්‍රයක් බැගින් බෙදා දී එහි මුල් කොටස සිසුන් ලවාම සම්පූර්ණ කරගැනීමට කටයුතු කරන්න.

| |
|---|
| මෙම ක්‍රියාකාරකම තුළ අනු කොටස් 3කි.<br>1.1. ශ්‍රවණ මාධ්‍යයෙන් ස්වර හඳුනාගැනීම. - ලකුණු 04<br>1.2. ශ්‍රවණ මාධ්‍යයෙන් තාල හඳුනාගැනීම. - ලකුණු 04<br>1.3. ශ්‍රවණ මාධ්‍යයෙන් රාග හඳුනාගැනීම. - ලකුණු 04 |

#### 1.1. ශ්‍රවණ මාධ්‍යයෙන් ස්වර හඳුනා ගැනීම. (ලකුණු = 04)

- මධ්‍ය 'ස' සිට උච්ච 'ස' දක්වා සප්තකය ඇතුළත ශුද්ධ ස්වර 4ක් 'ආ' කාරයෙන් ගායනය කර සිසුන්ට හඳුනා ගැනීමට සලස්වා ලකුණු සටහන් පත්‍රයේ අදාළ ස්ථානයේ **සිසුන් ලවා** සටහන් කරවා ගන්න.
- එක් ස්වරයකට ලකුණු 01 බැගින් ස්වර 4ට ලකුණු 04යි.

#### 1.2. ශ්‍රවණ මාධ්‍යයෙන් තාල හඳුනාගැනීම. (ලකුණු = 04)

- පරීක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් ගයනු/ වයනු ලබන නිර්දේශිත සරල ගීයක් ශ්‍රවණයට සලසා තාලය හඳුනා ගැනීමට යොමු කිරීම. (පහත සඳහන් කොටස් 4 ට 01 බැගින් ලකුණු 04කි.)
  - ලකුණු සටහන් පත්‍රයේ අදාළ ස්ථානයේ තාල පදයේ නම ලිවීම.
  - අදාළ හින්දුස්ථානි තාල පදය විභාග අනුව වෙන් කර ලිවීම. (තාල සංඥා මාත්‍රා අංක කිරීම් දැක්වීම අවශ්‍ය නැත.)
  - ඉහත තාලයට අයත් වෙනත් ගීතයක මුල් පාදයක් ලිවීමට සලස්වන්න. (සරල ගීතයක, නූර්ති ගීතයක හෝ ජන ගීතයක මුල් පාදයක් විය හැකි ය.)
  - ඉහත තාලයට සමාන දේශීය තිත නම් කිරීම. (විභාග කිරීම අවශ්‍ය නැත.)

#### 1.3. ශ්‍රවණ මාධ්‍යයෙන් රාග හඳුනා ගැනීම. (ලකුණු = 04)

- මේ සඳහා නිර්දේශිත රාග වන බිලාවල්, භූපාලි, කාෆි, යමන් සහ භෛරවී යන රාග අතුරෙන් එක් රාගයක් යොදා ගත හැකි ය. එම රාග අතුරෙන් එකකට අයත් ස්වර සංගතියක් හෝ දෙකක් ස්වරවලින් ගයා ශ්‍රවණයට යොමු කළ හැකි ය. තෙවරක් පමණක් ශ්‍රවණයට යොමු කිරීම ප්‍රමාණවත් ය.
- පහත දැක්වෙන කොටස් 4ට ලකුණු 01 බැගින් ලකුණු 04කි.
  - ලකුණු සටහන් පත්‍රයේ අදාළ ස්ථානයේ රාගයේ නම ලිවීම.
  - එම රාගයේ ආරෝහණ-ස්වර නියමිත සංඥා සමග අදාළ ස්ථානයේ ලිවීම.
  - එම රාගයේ අවරෝහණ ස්වර නියමිත සංඥා සමග අදාළ ස්ථානයේ ලවීම.
  - එම රාගයට අදාළ විශේෂ ලක්ෂණයක් ලිවීම. (නිදසුන් :- සියලුම ස්වර ශුද්ධය. තීව්‍ර මධ්‍යමය යෙදේ. ස්වර 5ක් පමණක් යෙදේ. කෝමළ ස්වර 4ම යෙදේ. ගනි ස්වර කෝමළ ය. ආදී වශයෙන් .......)

### 2. ක්‍රියාකාරකම:- රාගධාරී ගායන/වාදන ප්‍රායෝගික ක්‍රියාකාරකම්

නිර්දේශිත රාග අතුරෙන් ( බිලාවල්, භූපාලි, කාෆි, භෛරවී, යමන් ) ශිෂ්‍යයාගේ අභිමතය පරිදි තෝරාගත් රාගයේ මධ්‍යලය ගීතයක් ගායනය/වාදනය කිරීම අපේක්ෂිතය.

මෙම ක්‍රියාකාරකම තුළ අනු කොටස් 5කි.

2.1. තෝරාගත් රාගයේ ආරෝහණ-අවරෝහණ - ලකුණු 04

2.2. තෝරාගත් රාගයේ මධ්‍යලය ගීතයේ ස්ථායි කොටස - ලකුණු 04

2.3. තෝරාගත් රාගයේ මධ්‍යලය ගීතයේ අන්තරා කොටස - ලකුණු 04

2.4. තෝරාගත් රාගයේ මධ්‍යලය ගීතයට අදාළ තානාලංකාර දෙකක් - ලකුණු 04

2.5. ගායන/වාදන මාධූර්ය හා සමස්ත ශිල්පීය කුසලතාව. - ලකුණු 04

මුළු ලකුණු - 20කි.

**3. ක්‍රියාකාරකම :- රාග/ස්වර ඥානය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්**

නිර්දේශිත රාග අතුරෙන් (බිලාවල්, භූපාලි, කාෆි, භෛරවී, යමන්) පරීක්ෂක මණ්ඩලය විසින් නම් කරන රාගයේ (සර්ගම්)/ ලක්ෂණ ගීතය සහ ස්වර ගායනය/වාදනය කිරීම.

( මේ සඳහා 2 ක්‍රියාකාරකමෙහි මධ්‍ය ලය ගීතය සඳහා තෝරා ගත් රාගය හැර ඉතිරි රාග 4න් එක් රාගයක් නම් කළ යුතුය. **අවශ්‍ය නම්** රාග පහේ නම් ලියූ පත්‍රිකා අතුරෙන් එක් පත්‍රිකාවක් අපේක්ෂකයාට අහඹු ලෙස තෝරා ගැනීමට ඉඩ සැලසිය හැකි ය. එහි දී 2 ක්‍රියාකාරකමට තෝරාගත් රාගයේ නම දක්වෙන පත්‍රිකාව ඉවත් කිරීමට වග බලා ගත යුතු ය. අපේක්ෂකයා තෝරා ගන්නා පත්‍රිකාවේ සඳහන් රාගයට අදාළ ව පහත කොටස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසිය යුතුවේ. )

මෙම ක්‍රියාකාරකම තුළ අනු කොටස් 3කි.

3.1. නම් කළ රාගයේ සර්ගම්/ලක්ෂණ ගීතයේ ස්ථායි කොටස - ලකුණු 04

3.2. නම් කළ රාගයේ සර්ගම්/ ලක්ෂණ ගීතයේ අන්තරා කොටස - ලකුණු 04

3.3. නම් කළ රාගයට අදාළ ව මණ්ඩලයේ සාමාජිකයා විසින් ගයනු ලබන ස්වර ඛණ්ඩය ඒ ආකාරයෙන් ම අපේක්ෂකයා විසින් අනුකරණය කරමින් ගායනය/වාදනය කිරීම. - ලකුණු 04

මුළු ලකුණු - 12 කි.

**4. ක්‍රියාකාරකම :- ව්‍යවහාරික සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්**

සරල ගී, චිත්‍රපට ගී ( සිංහල, හින්දි) නූර්ති, නාඩගම්, නාට්‍යය, ගීත නාට්‍යය, ග්‍රැමෆෝන් ගී සහ කණ්ඩායම් ගීත අතුරෙන් **අපේක්ෂකයා විසින් අහඹු ලෙස තෝරා ගන්නා** ගී වර්ගයකට අදාළ නිර්දේශිත ගීතයක් ගායනය හෝ වාදනය කිරීම මෙහි දී අපේක්ෂිත ය.

අපේක්ෂකයා ගයන හෝ වයන අවස්ථාවේ දී මණ්ඩලයේ සාමාජිකයන් විසින් තාල වාදනයෙන් හා ස්වර වාදනයෙන් (සර්පිනාව, එස්රාජය හෝ වයලීනය හෝ එවැනි අදාළ භාණ්ඩයකින්) අපේක්ෂකයාට සහාය වීම සුදුසු වේ.

සිය කුසලතාවට අනුව ගී වර්ගයට අදාළ රංගනය සමග හෝ ප්‍රාසාංගිකව හෝ ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසිය යුතු ය. වාදනයක් නම් වාදන මාධූර්යය, පදමාලාවට උචිත වූ වාදන ප්‍රකාශනය හා ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ හැකි ය.

**මෙම ක්‍රියාකාරකම යටතේ**

- නම් කළ ගීත විශේෂයට අදාළ ව අපේක්ෂකයා විසින් තෝරා ගත් ගීතයක් නිවැරදි නාද මාලාව අනුව ගායනය හෝ වාදනය කළ යුතුය.

4.1. තෝරාගත් ගීතයේ ශ්‍රැතිය,තාලය පවත්වා ගැනීම හා ස්වරස්ථානවල නිවැරදිතාවය - ලකුණු 04

4.2. තෝරාගත් පදමාලාවේ/ පද මාලාවට උචිත වාදන ප්‍රකාශනයේ නිවැරදිතාවය - ලකුණු 04

4.3. තෝරාගත් ගීතයේ මුල් නාද මාලාවට අනුව තනුවේ නිවැරදිතාවය - ලකුණු 04

4.4. තෝරාගත් ගීතයේ ගායන/වාදන මාධූර්යය, හඬ පාලනය, සහ ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීම - ලකුණු 04

මුළු ලකුණු - 16 කි.

**5. ක්‍රියාකාරකම :- ජන ගී පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්**

නිර්දේශිත ජන ගීත දෙකක් ගායනය කිරීම මෙහි දී අපේක්ෂිත ය.

අපේක්ෂකයා ගයන අවස්ථාවේ දී මණ්ඩලයේ සාමාජිකයන් විසින් අවශ්‍ය විටෙක තාල වාදනයෙන් අපේක්ෂකයාට සහාය විය යුතු වේ.

මෙම ක්‍රියාකාරකම තුළ අනු කොටස් 2කි.

5.1. නිර්දේශිත ගැමි ගීයක් ගායනය (අනාසාතාත්මක හෝ ආසාතාත්මක)

5.2. වන්නම්, ප්‍රශස්ති, හටන් ගී අතුරෙන් ශිෂ්‍යයා තෝරාගත් වර්ගයකට අදාළ ගීතයක් ගායනය.

5.1. **නිර්දේශිත ගැමි ගීයක් ගායනය ( අනාසාතාත්මක හෝ ආසාතාත්මක)**

5.1.1. තෝරාගත් ගැමි ගීතයේ ශ්‍රැතිය, රිද්මය/තාලය පවත්වා ගැනීම හා ස්වරස්ථානවල නිවැරදිතාවය සහ හඬ පාලනය - ලකුණු 04

5.1.2. තෝරාගත් ගැමි ගීතයේ සම්ප්‍රදායික නාදාමාලාව ආරක්ෂා කර ගැනීම. පදමාලාවේ නිරවද්‍යතාවය, නිවැරදි උච්චාරණය, සහ ඉදිරිපත් කිරීම - ලකුණු 04

5.2. **වන්නම්, ප්‍රශස්ති, හටන් ගී අතරින් ගීතයක් ගායනය.**

5.2.1 තෝරාගත් වන්නමේ,ප්‍රශස්තියේ හෝ හටන් ගීතයේ ශ්‍රැතිය, රිද්මය/තාලය පවත්වා ගැනීම හා ස්වරස්ථානවල නිවැරදිතාවය සහ හඬ පාලනය - ලකුණු 04

5.2.2. තෝරාගත් ගීතයේ සම්ප්‍රදායික නාදාමාලාව ආරක්ෂා කර ගැනීම. පදමාලාවේ නිරවද්‍යතාවය, නිවැරදි උච්චාරණය, සහ ඉදිරිපත් කිරීම - ලකුණු 04

මුළු ලකුණු - 16 කි.

**6. ක්‍රියාකාරකම :- වාදනය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්**

වාදන අංග දෙකක් ඉදිරිපත් කිරීම මෙහි දී අපේක්ෂිත ය. ක්‍රියාකාරකම තුළ අනු කොටස් 2කි.

6.1. කැමති සංගීත භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය
හෝ
තබ්ලාවෙන් කැමති තාලයක ඨේකාව සමග කායදාවක් හා පල්ටාවක් වාදනය

6.2. ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය.

6.1.1 වාදනය කරන භාණ්ඩයේ වාදන ඉරියව්වල නිවැරදිතාවය - ලකුණු 04

6.1.2 වාදනය කරන ගීතයේ ස්වරස්ථානවල නිවැරදිතාවය/ වාදනය කරන තාලයේ අවනද්ධාක්ෂර වල නිවැරදිතාවය/ - ලකුණු 04

6.1.3 වාදන මාධූර්යය සහ විවිධ ශිල්පාංග භාවිත හැකියාව - ලකුණු 04

6.2.1 භාණ්ඩයේ වාදන ඉරියව් අතැඟිලි හැසිරවීමේ නිවැරදිතාවය - ලකුණු 04

6.2.2. වාදනය කරන ගීතයේ නාදමාලාවේ නිවැරදිතාවය - ලකුණු 04

6.2.3 වාදන මාධූර්යය, ස්වරපුවරුවට ආවේනික ශිල්පාංග භාවිත හැකියාව - ලකුණු 04

මුළු ලකුණු - 24කි.

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.**
**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020**
**පාසල් පාදක තක්සේරුකරණය යටතේ (40) සංගීතය (පෙරදිග) විෂයට අදාළ 11 ශ්‍රේණියේ**
**අවසාන තක්සේරුකරණ**
**විස්තරාත්මක ලකුණු සටහන් පත්‍රය**

| | |
|---|---|
| අයදුම්කරුගේ විභාග අංකය | |
| මධ්‍යස්ථානය/පාසල | |
| පරීක්ෂණ දිනය හා වරුව | |
| ප්‍රධාන විෂය ගායනය/වාදනය | |
| වාදනය කරන භාණ්ඩයේ නම | |

| අවසාන ලකුණ | |
|---|---|
| ඉලක්කමෙන් | |

එක් නිර්ණායකයකට පිරිනැමෙන ලකුණු සීමාව.

| මුළු ලකුණු | විශිෂ්ට මට්ටම නිපුණතාව | ඉහළ මට්ටම නිපුණතාව | සම්මාන මට්ටම නිපුණතාව | ආසන්න මට්ටමේ නිපුණතාව | අදාළ නොවේ. |
|---|---|---|---|---|---|
| 04 | 04 | 03 | 02 | 01 | -- |

එක් එක් ක්‍රියාකාරකමට අයත් නිර්ණායකවලට පිරිනැමෙන ලකුණ කවයකින් දක්වන්න.

**1. ක්‍රියාකාරකම :- ශ්‍රවණ පරීක්ෂණය** **ලකුණු 12 යි.**

**ස්වර ඥානය**

1.1 පරීක්ෂක විසින් 'ආ' කාරයෙන් ගයනු ලබන ස්වර හතර හඳුනාගෙන පිළිවෙළින් ලියන්න.
................................................................................................................ - 1 2 3 4

**තාල ඥානය**

i පරීක්ෂක විසින් ගයනු/වයනු ලබන ගීතය අයත් තාලය හඳුනාගෙන නම් කරන්න.
................................................................................................................- 1

ii ඉහත නම් කළ තාල පදය විභාග අනුව වෙන් කර ලියන්න.
( තාල සංඥා මාත්‍රා අංක කිරීම් දැක්වීම අවශ්‍ය නැත. )
................................................................................................................- 1

iii ඉහත තාලයට අයත් ඔබ දන්නා වෙනත් ගීතයක මුල් පාදයක් ලියන්න. ( සරල ගීතයක්, නූර්ති ගීතයක හෝ ජන ගීතයක මුල් පාදයක්.)
................................................................................................................- 1

iv ඉහත තාලයට සමාන දේශීය තිත නම් කරන්න.( විභාග කිරීම අවශ්‍ය නැත.)
................................................................................................................- 1

- 1 2 3 4

**රාග ඥානය**

i පරීක්ෂක විසින් ගයනු/වයනු ලබන ස්වර ඛණ්ඩ අයත් රාගය හඳුනාගෙන නම් කරන්න.
................................................................................................................- 1

ii එම රාගයේ ආරෝහණ-ස්වර නියමිත සංඥා සමග පහත ලියා දක්වන්න.
................................................................................................................- 1

iii එම රාගයේ අවරෝහණ-ස්වර නියමිත සංඥා සමග පහත ලියා දක්වන්න.
................................................................................................................- 1

iv එම රාගයට අදාළ විශේෂ ලක්ෂණයක් තෝරන්න.
(සියලු ම ස්වර ශුද්ධය. තීව්‍ර මධ්‍යමය යෙදේ. ස්වර 5ක් පමණක් යෙදේ.
කෝමළ ස්වර 4ම යෙදේ. ගනි ස්වර කෝමළය.)..........................................- 1

- 1 2 3 4

**2. ක්‍රියාකාරකම :- රාගධාරී ගායන/වාදන ප්‍රායෝගික ක්‍රියාකාරකම් ලකුණු 20 යි.**

- ශිෂ්‍යයාගේ අභිමතය පරිදි තෝරාගත් රාගයේ මධ්‍යලය ගීතයක් ගායනය/වාදනය කිරීම

2.1. තෝරාගත් රාගයේ ආරෝහණ-අවරෝහණ ඉදිරිපත් කිරීමට -- 1 2 3 4
2.2. තෝරාගත් රාගයේ මධ්‍යලය ගීතයේ ස්ථායි කොටසට -- 1 2 3 4
2.3. තෝරාගත් රාගයේ මධ්‍යලය ගීතයේ අන්තරා කොටස -- 1 2 3 4
2.4. තෝරාගත් රාගයේ මධ්‍යලය ගීතයට අදාල තානාලංකාර දෙකට -- 1 2 3 4
2.5. ගායන/වාදන මාධූර්ය හා සමස්ත ශිල්පීය කුසලතාව. -- 1 2 3 4

- නිර්ණායක 5 ට මුලු ලකුණු 20 කි.

**3. ක්‍රියාකාරකම :- රාග/ස්වර ඥානය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ලකුණු 12 යි.**

- නිර්දේශිත රාග අතරින් ( බිලාවල්, භූපාලි, කාෆි, භෛරවී, යමන් ) පරීක්ෂක මණ්ඩලය විසින් නම් කරන රාගයේ සර්ගම්/ලක්ෂණ ගීතය හා ස්වර ගායනය/ වාදනය කිරීම .

3.1. නම් කළ රාගයේ සර්ගම්/ලක්ෂණ ගීතයේ ස්ථායි කොටසට -- 1 2 3 4
3.2. නම් කළ රාගයේ සර්ගම්/ලක්ෂණ ගීතයේ අන්තරා කොටස -- 1 2 3 4
3.3. නම්කළ රාගයට අදාලව මණ්ඩලයේ සාමාජිකයා ගයන ස්වර ඛණ්ඩය ඒ ආකාරයෙන් ම ශිෂ්‍යා අනුකරණය කරමින් ගායනය/වාදනය කිරීම. -- 1 2 3 4.

**4. ක්‍රියාකාරකම :- ව්‍යවහාරික සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්. ලකුණු 16 යි.**

- සරල ගී, චිත්‍රපට ගී ( සිංහල , හින්දි) නූර්ති, නාඩගම්, නාට්‍යය, ගීත නාට්‍යය, ග්‍රැමෆෝන් ගී, සහ කණ්ඩායම් ගීත අතරින් ගීතයක් ගායනය/ වාදනය කිරීම.

4.1. තෝරාගත් ගීතයේ ශ්‍රැතිය,තාලය පවත්වා ගැනීම හා ස්වරස්ථානවල නිවැරදිතාවය -- 1 2 3 4.
4.2. තෝරාගත් පදමාලාවේ/ පද මාලාවට උචිත වාදන ප්‍රකාශනයේ නිවැරදිතාවය -- 1 2 3 4.
4.3. තෝරාගත් ගීතයේ මුල් නාද මාලාවට අනුව තනුවේ නිවැරදිතාවය -- 1 2 3 4.
4.4. තෝරාගත් ගීතයේ ගායන/වාදන මාධූර්යය, හඬ පාලනය, සහ ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීම -- 1 2 3 4.

**5. ක්‍රියාකාරකම :- ජන ගී පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්- ලකුණු 16**

- නිර්දේශිත ජන ගීත දෙකක් ගායනය කිරීම මෙහිදී අපේක්ෂිතය.

5.1. නිර්දේශිත ගැමි ගීයක් ගායනය ( අනාඝාතාත්මක හෝ ආඝාතාත්මක)-ලකුණු 08 යි.
5.1.1. තෝරාගත් ගැමි ගීතයේ ශ්‍රැතිය, රිද්මය/තාලය පවත්වා ගැනීම හා ස්වරස්ථානවල නිවැරදිතාවය සහ හඬ පාලනය -- 1 2 3 4.
5.1.2. තෝරාගත් ගැමි ගීතයේ සම්ප්‍රදායික නාදාමාලාව ආරක්ෂා කර ගැනීම. පදමාලාවේ නිරවද්‍යතාවය, නිවැරදි උච්චාරණය, සහ ඉදිරිපත් කිරීම -- 1 2 3 4..
5.2. වන්නම්, ප්‍රශස්ති, හටන් ගී අතරින් ගීතයක් ගායනය. -ලකුණු 08 යි.
5.2.1 තෝරාගත් වන්නමේ,ප්‍රශස්තියේ හෝ හටන් ගීතයේ ශ්‍රැතිය, රිද්මය/තාලය පවත්වා ගැනීම හා ස්වරස්ථානවල නිවැරදිතාවය සහ හඬ පාලනය -- 1 2 3 4.
5.2.2. තෝරාගත් ගීතයේ සම්ප්‍රදායික නාදාමාලාව ආරක්ෂා කර ගැනීම. පදමාලාවේ නිරවද්‍යතාවය, නිවැරදි උච්චාරණය, සහ ඉදිරිපත් කිරීම -- 1 2 3 4.

**6. ක්‍රියාකාරකම :- වාදනය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් - ලකුණු 24**

**6.1. කැමති සංගීත භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය හෝ තබ්ලාවෙන් මණ්ඩලය විසින් නම් කරන නිර්දේශිත කොටසක් වාදනය**

6.1.1 වාදනය කරන භාණ්ඩයේ වාදන ඉරියව්වල නිවැරදිතාවය -- 1 2 3 4.
6.1.2 වාදනය කරන ගීතයේ ස්වරස්ථානවල නිවැරදිතාවය/ වාදනය කරන තාලයේ අවනද්ධාක්ෂර වල නිවැරදිතාවය/ -- 1 2 3 4.
6.1.3 වාදන මාධූර්යය සහ විවිධ ශිල්පාංග භාවිත හැකියාව -- 1 2 3 4.

**6.2. ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය.**

6.2.1 භාණ්ඩයේ වාදන ඉරියව් අතැගිලි හැසිරවීමේ නිවැරදිතාවය -- 1 2 3 4.
6.2.2. වාදනය කරන ගීතයේ නාදමාලාවේ නිවැරදිතාවය -- 1 2 3 4.
6.2.3 වාදන මාධූර්යය, ස්වරපුවරුවට ආවේනික ශිල්පාංග භාවිත හැකියාව -- 1 2 3 4.

අවසාන ලකුණු:-......................

අවසාන ලකුණ නිවැරදිය. මණ්ඩලය එකඟවෙමු. එකතුව පරීක්ෂා කළෙමු.

1 පරීක්ෂකගේ නම:-.........................................................අත්සන:-...............................................

2 පරීක්ෂකගේ නම:-.........................................................අත්සන:-...............................................

ප්‍රධාන පරීක්ෂකගේ නම:-.........................................................අත්සන:-...............................................

දිනය:- .............................................

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2020

පාසල් පාදක තක්සේරුකරණය යටතේ (40) සංගීතය (පෙරදිග) විෂයට අදාළ 11 ශ්‍රේණියේ

අවසාන තක්සේරුකරණය

සංක්ෂිප්ත ලකුණු සටහන් පත්‍රිකාව

පාසලේ/ මධ්‍යස්ථානයේ නම............................................................ මණ්ඩල අංකයඃ-............................................................

| අනු අංකය | විභාග අංකය | ක්‍රියාකාරකම.01 ලකුණු 12 යි | ක්‍රියාකාරකම.02 ලකුණු 20 යි | ක්‍රියාකාරකම.03 ලකුණු 12 යි | ක්‍රියාකාරකම.04 ලකුණු 16 යි | ක්‍රියාකාරකම.05 ලකුණු 16 යි | ක්‍රියාකාරකම.06 ලකුණු 24 යි | මුළු ලකුණු 100 යි |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

| අනු අංකය | විභාග අංකය | ක්‍රියාකාරකම.01 ලකුණු 12 යි | ක්‍රියාකාරකම.02 ලකුණු 20 යි | ක්‍රියාකාරකම.03 ලකුණු 12 යි | ක්‍රියාකාරකම.04 ලකුණු 16 යි | ක්‍රියාකාරකම.05 ලකුණු 16 යි | ක්‍රියාකාරකම.06 ලකුණු 24 යි | මුළු ලකුණු 100 යි |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

අවසාන ලකුණු නිවැරදි බව සහතික කරමු.

1 පරීක්ෂකගේ නම:-..........................................................අත්සන:-..............................................    සංකේත අංකය:-...............................................

2 පරීක්ෂකගේ නම:-..........................................................අත්සන:-..............................................    ...............................................

ප්‍රධාන පරීක්ෂකගේ නම:-..........................................................අත්සන:-..............................................    ...............................................

දිනය:- ...............................................